(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 1(14).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2023 මැයි 26 සිකුරාදා**

**2023 ජූනි 06 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

බැංකු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

පාර්ලිමේන්තු අයවැය කාර්යාලය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ගුවන් ප්‍රවාහන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— උදර්පණ පනත යටතේ නියමය,— ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පණ පනතේ 2 වගන්තිය යටතේ නාමෝද්දිෂ්ට පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 පෙබරවාරි 14 දිනැති අංක 2319/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 1),— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/49 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 2),— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/50 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 3),— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 4),— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 5),— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/53 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 6),— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 7),— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/55 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 8),— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/56 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 9),— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/57 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 10),— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 44 වගන්තිය සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 13 දිනැති අංක 2262/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 11),— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 126 සහ 127 වගන්ති සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 අගෝස්තු 09 දිනැති අංක 2292/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 12),— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 සැප්තැම්බර් 22 දිනැති අංක 2298/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 13),— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 126 සහ 321 වගන්ති යටතේ වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ඔක්තෝබර් 26 දිනැති අංක 2303/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙන යන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත යටතේ නියෝග,— 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙන යන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනතේ 3(5) වගන්තිය සමඟ කියවිය යුතු 10 වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජූලි 07 දිනැති අංක 2287/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග,— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6, 10, 11, 13, 14, 16 සහ 31 වගන්ති සමඟ කියවිය යුතු 117 වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 අගෝස්තු 09 දිනැති අංක 2292/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.26 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනා සම්මතය,— 2021 අංක 30 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 36 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2021 අංක 30 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 36 දරන නියමය

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මම 2021 අංක 30 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව එකී පනතේ තෙවන උපලේඛනයේ විෂය අංක 31002 "ගබඩා අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු.120,000,000 සිට රු.223,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු.30,000,000 සිට රු.38,000,000 දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2022.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍ය

2023. 05. 16 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

**2023 ජූනි 09 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

836/2023

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද වාහන සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුළු මුදල සහ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වාහන ආනයනය කරන ලද රටවල් කවරේද;

(iv) එම වාහන ආනයනය කරන ලද සමාගම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2023 ජූනි 09 සිකුරාදා)**

3268/2023

ගරු එම්. එස්. තවුෆික් මහතා,— බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ, වක්ෆ් අංශය විසින් මුස්ලිම් පල්ලි, තක්කියා, සාවියා සහ දර්ගා ඇතුළු පුණ්‍යායතනවලට අයත් නිශ්චල හා චංචල දේපල සම්බන්ධයෙන් දත්ත සමුදායක් පවත්වා නොගැනීමට හේතු කවරේද;

(ii) එසේ දත්ත සමුදායක් පවත්වා නොගැනීම හේතුවෙන් ඉහත සඳහන් ආයතනවලට අයත් දේපල, පුද්ගලික දේපල ලෙස පරිහරණය කිරීම සහ වක්ෆ් මණ්ඩලයේ අනුදැනුමකින් තොරව එම දේපල අධික මිල ගණන්වලට අලෙවි කිරීම වැනි දූෂණ හා අක්‍රමිකතා සිදු වන බව දන්නේද;

(iii) එම දූෂණ හා අක්‍රමිකතා වැළැක්වීමේ මූලික පියවර ලෙස ඉහත දේපල සම්බන්ධයෙන් විධිමත් දත්ත සමුදායක් ගොඩනැගීම සඳහා කඩිනම් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 ජූනි 20 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1314/2023

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය සහ අවසාන පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට එම ව්‍යාපෘතියේ වැඩ අවසන් කර තිබේද;

(iii) එය ආරම්භ කිරීමේ අරමුණු කවරේද;

(iv) මේ වන විට එම අරමුණු ඉටු වී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දැදුරු ඔය ජලාශයේ දකුණු ඉවුරු ඇළෙන් සහ වම් ඉවුරු ඇළෙන් මුදා හැරීමට සැලසුම් කර ඇති උපරිම ජල ධාරිතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසු සැලසුම් කරන ලද පරිදි වම් ඉවුරු ඇළෙන් සහ දකුණු ඉවුරු ඇළෙන් ජලය මුදා හැරීම සිදු කරන්නේද;

(iii) දකුණු ඉවුරේ සහ වම් ඉවුරේ ව්‍යුහයන් නිසි අත්තිවාරමකින් හෝ නිසි සම්බන්ධ කිරීම්වලින් තොරව ඉදිකර ඇති බව පිළිගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට සහ ජලයෙන් යටවන ඉඩම් සඳහා වන්දි ගෙවීමට දරන ලද පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1318/2023

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කැලණි ගඟ ආශ්‍රිතව ස්ථාපිත කර ඇති කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කර්මාන්තශාලාවලින් ඉවතලන අපවිත්‍ර ජලය එම ගඟට එක්කරනු ලබන බව දන්නේද;

(iii) එම අපවිත්‍ර ජලය හේතුවෙන් කැලණි ගං ජලයට සිදු වන හානිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iv) අපවිත්‍ර ජලය කැලණි ගඟට මුදා හැරීම වැළැක්වීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1320/2023

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) ඇලහැර-ගිරිතලය අභයභූමියේ විශාලත්වය අක්කරවලින් කොපමණද;

(ii) මේ වනවිට එම අභයභූමියට අයත් අක්කර 250ක් පමණ විශාලත්වයකින් යුත් ප්‍රදේශයක විශාල පරිසර හානියක් සිදු වී ඇති බව දන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධව අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1328/2023

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇති මහජන බැංකු ශාඛා සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2015 සිට 2020 දක්වා එම ශාඛා විසින් රුපියල් මිලියන 5කට වඩා වැඩි ණය ලබා දෙන ලද සමාගම් හා පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම කාලය තුළ ලබා දෙන ලද ණය මුදල් අතරින් මේ වනවිට අය කර ගැනීමට නොහැකිවී ඇති ණය මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම ණය මුදල් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(v) ඉහත (iii)හි සඳහන් ණය මුදල් අතරින් බොල් ණය ලෙස කපා හැර ඇති ණය මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1460/2023

ගරු මායාදුන්න චින්තක අමල් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ටින් මාළු කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කර්මාන්තශාලාවලින් වාර්ෂිකව නිෂ්පාදනය කරනු ලබන ටින් සංඛ්‍යාව කොපමණද;

(iii) ටින් මාළු කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) නව ටින් මාළු කර්මාන්තශාලා ආරම්භ කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1505/2023

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට "පාසල් පරිසර වැඩසටහන්" ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, "පාසල් පරිසර වැඩසටහන්" ක්‍රියාත්මක කරනු ලබන පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම වැඩසටහන් සඳහා පාසල් සිසුන් මෙන්ම ගුරුවරුන්ද සම්බන්ධ කරගෙන තිබේද;

(iv) එම ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(v) "පාසල් පරිසර වැඩසටහන්" සඳහා වඩාත් සක්‍රිය දායකත්වයක් ලබා දෙනු ලබන පාසල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1544/2023

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ බහුලව පුවක් වගා කරනු ලබන ප්‍රදේශ කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ වාර්ෂිකව නිෂ්පාදනය කරනු ලබන කරුංකා පුවක් ප්‍රමාණය කොපමණද;

(iii) වර්ෂ 2019 සිට මේ දක්වා අපනයනය කර ඇති කරුංකා පුවක් ප්‍රමාණය සහ එමඟින් උපයාගෙන ඇති විදේශ විනිමය ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ශ්‍රී ලංකාවේ පුවක් වගාව ප්‍රචලිත කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1576/2023

ගරු සංජීව එදිරිමාන්න මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ධාවන බලපත්‍ර නිකුත් කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) සාමාන්‍ය මාර්ග සහ අධිවේගී මාර්ග සඳහා මේ වනවිට නිකුත් කර ඇති ධාවන බලපත්‍ර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට නිකුත් කර ඇති බලපත්‍ර වෙනත් පාර්ශ්වයකට පැවරීමේ හැකියාවක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1617/2023

ගරු තිස්ස අත්තනායක මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රජයට පවරා ගන්නා ලද ඉඩම් ප්‍රමාණය හෙක්ටයාරවලින් කොපමණද;

(ii) එම ඉඩම් වෙනුවෙන් ගෙවිය යුතු මුළු වන්දි මුදල කොපමණද;

(iii) එම වන්දි වෙනුවෙන් පොළී මුදලක් ගෙවීමට සිදු වූයේ නම්, ඊට හේතු කවරේද;

(iv) වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් රු. 4,620,420/= ක පොළී මුදලක් වැඩිපුර ගෙවීමට හේතු කවරේද;

(v) වැඩිපුර ගෙවන ලද එම පොළී මුදල, නැවත අයකර ගැනීමට පියවර ගෙන තිබේද;

(vi) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1634/2023

ගරු මිලාන් ජයතිලක මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති රාජ්‍ය නොවන සංවිධාන සංඛ්‍යාව;

(ii) ඒ අතරින් මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින රාජ්‍ය නොවන සංවිධාන සංඛ්‍යාව;

(iii) අලුතින් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කර ඇති රාජ්‍ය නොවන සංවිධාන සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති රාජ්‍ය නොවන සංවිධාන විසින් වාර්ෂිකව ගිණුම් වාර්තා ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2023 ජූනි 21 බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1677/2023

ගරු වාල්ස් නිර්මලනාදන් මහතා,— වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ, ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිරුමුරිකණ්ඩි ගම්මානයේ ජනතාව විසින් භාවිතා කරන ලද අක්කර 10ක පමණ විශාලත්වයකින් යුතු ඉඩම යුද සමයට පෙර අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඉහත ගම්මානයේ ජනතාවට බෙදාදීම සඳහා කටයුතු කරන ලද අවස්ථාවේදී වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඊට බාධා කරන ලද බවත්;

(ii) එම ඉඩමේ මේ වනවිට නිවාස, නිවාස අත්තිවාරම්, ළිං, වැසිකිළි, ක්‍රීඩාපිටි ආදිය පවතින බවත්;

(iii) එම ඉඩම ජනතාවට බෙදා දීම සඳහා අනුමතිය ඉල්ලා ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම්වරයා විසින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත්කර තිබුණද මේ දක්වා ඒ සඳහා අනුමතිය ලැබී නොමැති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ඉඩම ජනතාවට බෙදා දීම සඳහා පියවර ගන්නේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1758/2023

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අරගලකරුවන් විසින් ගෝල්ෆේස් පිටියට සිදු කරන ලද අලාභය කොපමණද;

(ii) එම අලාභය අය කර ගැනීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iv) ඒ සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව නීතිමය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1800/2023

ගරු කුමාරසිරි රත්නායක මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ ඇති විවිධ සේවා සමුපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) එම දිස්ත්‍රික්කයේ ඇති සමුපකාර ප්‍රාදේශික වෙළඳසැල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ප්‍රාදේශික වෙළඳසැල්වල සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම වෙළඳසැල් සඳහා අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය සීමාසහිත ලංකා සතොස ආයතනය විසින් සපයනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1811/2023

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "එක්ස්ප්‍රස් පර්ල්" නෞකාවේ අනතුර හේතුවෙන් විශාල පරිසර හානියක් සිදු වූ බව පිළිගන්නේද;

(ii) එම පරිසර හානිය ගණනය කිරීමේ හා ඒ සම්බන්ධයෙන් වන්දි ලබා දීමේ ක්‍රියාවලියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2530/2023

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කින්නියා, මුතූර්, වෙරුගල්, තඹලගමුව සහ කුච්චවේලි යන එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රජයේ ඉඩම්වල පදිංචිව සිටින ඉඩම් හිමිකම් ඔප්පු නොමැති පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රජයේ ඉඩම්වල පදිංචිව සිටින, හිමිකම් ඔප්පු ලබා දී ඇති පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (i) හි සඳහන් පවුල් සඳහා ඔප්පු ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නේද;

(iv) එසේ නම්, එම වැඩසටහන ක්‍රියාත්මක කරන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2576/2023

ගරු ඩී. වීරසිංහ මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගෘහාශ්‍රිත සහ වගාවන්ට හානිකරනු ලබන මීයන් වඳ කිරීම සඳහා රසායනික විෂ ද්‍රව්‍ය භාවිතා කරනු ලබන බව දන්නේද;

(ii) එම රසායනික විෂ ද්‍රව්‍යවල සංයුතිය තීරණය කරනු ලබන ආයතනය කවරේද;

(iii) රසායනික විෂ ද්‍රව්‍ය ශරීර ගතවීම හේතුවෙන් ජීවිතක්ෂයට පත් වන මීයන් අනුභව කිරීමෙන් ශ්‍රී ලංකාවට ආවේණික සතුන්ද ජීවිතක්ෂයට පත් වන බව දන්නේද;

(iv) එසේ නම්, මී උවදුර මර්දනය කිරීම සඳහා ජීව විද්‍යාත්මක ක්‍රමවේදයන් අනුගමනය කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2623/2023

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කොළඹ වරාය නගර ව්‍යාපෘතියේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපල හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2692/2023

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දුර ගමන් සේවාවල යෙදෙන සුඛෝපභෝගී බස්රථවලින් අය කරනු ලබන වාර්ෂික බදු මුදල කොපමණද;

(ii) මාර්ග බලපත්‍ර සඳහා එම බස්රථවලින් අය කරනු ලබන මුදල කොපමණද;

(iii) ඉන්ධන, ටයර් සහ වාහන අමතර කොටස් මිල අධික ලෙස ඉහළ ගොස් ඇති අවස්ථාවකදී ඉහත ගාස්තු අය කිරීම සාධාරණ වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ බස් කර්මාන්තය සඳහා ලබා දිය හැකි සහන කවරේද;

(ii) මගී ජනතාවට ප්‍රශස්ත ප්‍රවාහන සේවාවක් ලබා දීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2844/2023

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂි උපකරණ හා මෙවලම්වල විවෘත වෙළෙඳපොළ මිල අධික ලෙස ඉහළ ගොස් ඇති බවත්;

(ii) කෘෂිකර්ම කටයුතු සඳහා උපකරණ මිලදී ගැනීමට නොහැකිව ගොවීන් දැඩි දුෂ්කරතාවයකට මුහුණ දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) කෘෂි මෙවලම් හා උපකරණ සහන මිලට ලබාදීම සඳහා වැඩපිළිවෙළක් සකස් කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2878/2023

ගරු යදාමිණී ගුණවර්ධන මහතා,— කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලාංකිකයන් විශාල ප්‍රමාණයක් විදේශ රැකියාවල නියුතුව සිටින අතර සාමාන්‍යයෙන් එක් පුද්ගලයෙකු නැවත අප රට වෙත ප්‍රේෂණය කරන මුදල, පසුගිය දශක දෙක තුනකට පෙර ප්‍රමාණයට වඩා, මේ වනවිට ඉහළ ගොස් ඇති බව දන්නේද;

(ii) මෙලෙස වැඩිම ශ්‍රී ලාංකික රටවිරුවන් සිටින රටවල් දහය සහ නගර දහය මොනවාද;

(iii) මෙලෙස වැඩිම ශ්‍රී ලාංකික ඒක පුද්ගල ප්‍රේෂණය සාමාන්‍ය අගයන් ඇති, රටවල් දහය සහ නගර දහය මොනවාද;

(iv) එලෙසම සමස්ත අගයක් ලෙස, වැඩිම ප්‍රේෂණ සිදුකරන රටවල් දහය සහ නගර දහය මොනවාද;

(v) ඉහත සඳහන් රටවල් හෝ නගරවල සිට මුදල් ප්‍රේෂණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ මහ බැංකුව විසින් අනුමත යම් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක පහසුකම් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 ජූනි 22 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2934/2023

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභා වාර්තාව අනුව එම ප්‍රහාරය සම්බන්ධයෙන් චෝදනා එල්ල වී ඇති පොලිස් නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) චෝදනා එල්ල වී ඇති ඉහත එක් එක් පොලිස් නිලධාරියාගේ නම, පාස්කු ප්‍රහාරය සිදු කරනු ලබන අවස්ථාව වනවිට දැරූ තනතුර හා රාජකාරි ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම නිලධාරීන් අතරින් මේ වනවිට සේවයේ නිරතව සිටින එක් එක් නිලධාරියාගේ නම හා සේවා ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම නිලධාරීන් අතරින් සමහර නිලධාරීන් ශ්‍රී ලංකා පොලිසියේ ඉහළ තනතුරුවල සේවය කිරීම හේතුවෙන් පාස්කු ප්‍රහාරය සම්බන්ධ පරීක්ෂණ අඩාල කිරීමට හෝ පරීක්ෂණ වාර්තා වෙනස් කිරීමට හැකියාවක් තිබෙන බව පිළිගන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2968/2023

ගරු හේෂා විතානගේ මහතා,— ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලවරණ පවත්වන ලද දින කවරේද;

(ii) එම එක් එක් නිලවරණයෙන් ජයග්‍රහණය කර අදාළ තනතුරුවලට පත් වූ එක් එක් පුද්ගලයාගේ නම, ලිපිනය හා තනතුරු නාමය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පුද්ගලයන්ට ගෙවන ලද වැටුප් හා දීමනා සහ ලබා දෙන ලද ඉන්ධන හා වෙනත් පහසුකම් වෙනුවෙන් දරන ලද වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පුද්ගලයන් වෙනුවෙන් දරන ලද ඉහත වියදම්වලට සාපේක්ෂව ක්‍රිකට් ක්‍රීඩාවේ සංවර්ධනය උදෙසා ඔවුන්ගෙන් ලැබී ඇති දායකත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3076/2023

ගරු අශෝක් අබේසිංහ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් දෛනික ධාවනය සඳහා භාවිතා කරනු ලබන දුම්රිය එන්ජින්, බලවේග කට්ටල සහ දුම්රිය මැදිරි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

(ii) දෛනිකව ධාවනය කරනු ලබන දුම්රිය ගමන් වාර සංඛ්‍යාව;

(iii) දෛනිකව දුම්රිය භාවිතා කරනු ලබන මගීන් සංඛ්‍යාව;

(iv) දෙපාර්තමේන්තුවේ දෛනික ආදායම;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2015 සිට 2022 දක්වා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ වාර්ෂික ආදායම සහ වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3092/2023

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමට තීරණය කර තිබේද;

(ii) එසේ නම්, එම ප්‍රතිව්‍යුහගතකරණය හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ සිදු කරනු ලබන වෙනස්කම් කවරේද;

(iii) මේ වනවිට ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගෙවීමට ඇති මුළු ණය ප්‍රමාණය කොපමණද;

(iv) එම ණය කළමනාකරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3105/2023

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වතු පාසල් පදනම් කර ගනිමින් ලබා දී ඇති ගුරු සහායක තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම පත්වීම් ලබා දෙන ලද පදනම කවරේද;

(iii) ඒවා ලබා දෙන ලද පළාත් කවරේද;

(iv) ඒවා ලබා දෙන ලද දිනය කවරේද;

(v) ඔවුන් පිහිටුවන ලද මාසික වැටුප් පරිමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ගුරු සහායකයන් අතරින් මේ වනවිට අවුරුදු දෙකක ගුරු අභ්‍යාස පුහුණු පාඨමාලාව හදාරා ඇති සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුරු සහායකයන් ස්ථිර ගුරු සේවය සඳහා අන්තර්ග්‍රහණය නොකිරීමට හේතු කවරේද;

(iii) ඔවුන් ස්ථිර ගුරු සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන දිනය කවරේද;

(iv) ගුරු සහායක පත්වීම් ලබා දෙන ලද දිනය, ඔවුන්ගේ ගුරු සේවයේ මුල් පත්වීම් දිනය ලෙස සැළකීමට කටයුතු කරන්නේද;

(v) ගුරු සහායක තනතුරේ සේවා කාලය, ඔවුන්ගේ ගුරු සේවයේ සේවා කාලය සඳහා එකතු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?

3169/2023

ගරු දයාසිරි ජයසේකර මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ඉල්ලුම් කරනු ලබන රටවල් කවරේද;

(ii) එම එක් එක් රට විසින් ශ්‍රී ලංකාවට ලබා දෙන බවට දන්වා ඇති රැකියා අවස්ථා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදේශ රැකියා සඳහා භාෂා සහතික අවශ්‍ය රටවල් කවරේද;

(ii) වලංගු වෘත්තීය පුහුණු සහතික අවශ්‍ය රටවල් කවරේද;

(iii) භාෂා සහතික සහ වෘත්තීය පුහුණු සහතික අවශ්‍ය නොවන රටවල් තිබේද;

(iv) එසේ නම්, එම රටවල් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් යොමු කිරීමට මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(ii) ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට විදේශ රැකියා සඳහා අවශ්‍ය සුදුසුකම්, කඩිනමින් සපුරාලීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3226/2023

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 වර්ෂයෙන් පසු ජාතික පාසල් බවට පත් කරන ලද කළුතර දිස්ත්‍රික්කයේ පළාත් පාසල් සංඛ්‍යාව, එම එක් එක් පාසලේ නම, අයත් අධ්‍යාපන කලාපය, සිසුන් සංඛ්‍යාව, ජාතික පාසලක් බවට පත් කරන ලද දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) පළාත් පාසලක් ලෙස පැවති අවධියේ සිට දීර්ඝ කාලයක් ඉහත සඳහන් පාසල්වල සේවය කර, ස්ථාන මාරු ඉල්ලා ඇති ගුරුවරුන් සංඛ්‍යාව, එම එක් එක් ගුරුවරයා සේවය කරනු ලබන පාසල, සේවා කාලය සහ අධ්‍යාපන කලාපය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ස්ථාන මාරු ලබා දීම සඳහා කටයුතු කරන්නේද;

(iv) ඒ හේතුවෙන් ඇති වන ගුරු පුරප්පාඩු පිරවීමට පියවර ගන්නේද;

(v) එම ස්ථාන මාරු ලබා දීමේදී අදාළ පාසල, ජාතික පාසලක් බවට පත් කරන ලද දින සිට වර්ෂ තුනක සේවා කාලයක් සපුරාලිය යුතු බවට තීරණයක් ගෙන තිබේද;

(vi) එසේ නම්, ඉහත (ii) හි සඳහන් ගුරුවරුන්ට ඒ හේතුවෙන් සිදු වන අසාධාරණය මඟහරවාලීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3227/2023

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ සේවකයන් විදේශ රැකියා සඳහා යොමු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබේද;

(ii) එසේ නම්, මේ වනවිට විදේශ රැකියා සඳහා ඉල්ලුම් කර ඇති රජයේ සේවකයන් සංඛ්‍යාව, ඒ අතරින් මේ වනවිට විදේශ රැකියා සඳහා යොමු කර ඇති රජයේ සේවකයන් සංඛ්‍යාව සහ විදේශ රැකියා සඳහා ඉදිරියේදී යොමු කිරීමට අපේක්ෂා කරනු ලබන රජයේ සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) විදේශ රැකියා සඳහා යොමු කරවනු ලබන රජයේ සේවකයන් එම රැකියා සඳහා පුහුණු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3237/2023

ගරු වාසුදේව නානායක්කාර මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2021 වර්ෂයේ සිට අනියම් පදනම මත බඳවා ගන්නා ලද සේවකයන් 500 ක් පමණ මේ වනවිට සීමාසහිත ලංකා සතොස ආයතනයේ සේවය කරමින් සිටින්නේද;

(ii) ඔවුන්ට පත්වීම් ලිපි ලබා දී තිබේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සේවකයන්ට අදාළ සේවා කොන්දේසි කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන කම්කරු නීති එම සේවකයන් සම්බන්ධයෙන් උල්ලංඝනය වී තිබේද;

(iii) රජයේ සේවකයන් සම්බන්ධයෙන් වර්ෂ 2016 සිට 2019 දක්වා යහපාලන රජය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අනුව මෙම සේවකයන්ට වැටුප් ගෙවා තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3316/2023

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොවිඩ්-19 වසංගතය මර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද එන්නත් වර්ග කවරේද;

(ii) ආනයනය කරන ලද එන්නත් සංඛ්‍යාව එක් එක් එන්නත් වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත එන්නත් වර්ග නිෂ්පාදනය කරන ලද රටවල් කවරේද;

(iv) එම එන්නත් ආනයනය කරනු ලැබූ ආයතන කවරේද;

(v) එන්නත් මිලදී ගැනීමේදී විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පළමුවැනි, දෙවැනි, තෙවැනි හා සිව්වැනි මාත්‍රා සඳහා භාවිතයට ගන්නා ලද එන්නත් සංඛ්‍යාව එක් එක් එන්නත් වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත (අ)(i)හි සඳහන් එන්නත් සම්පූර්ණයෙන්ම භාවිතයට ගනු ලැබුවේද;

(iii) ඉතිරි වූයේ නම්, එම ඉතිරි වූ ප්‍රමාණය එක් එක් එන්නත් වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) නියමිත එන්නත් මාත්‍රා ලබා ගත් පුද්ගලයන්ට සංකූලතා ඇති වූයේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 ජූනි 23 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1/2023

ගරු වමින්ද විජේසිරි මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පසුගිය "යහපාලන රජය" පැවති අවදියේ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැඳුම්කර වංචාව සිදු වන අවස්ථාවේදී ශ්‍රී ලංකා මහ බැංකුව අයත්ව තිබූ අමාත්‍යාංශය කවරේද;

(ii) එම අවස්ථාවේදී ඉහත සඳහන් අමාත්‍යාංශය භාරව සිටි අමාත්‍යවරයාගේ නම සහ අමාත්‍යාංශ ලේකම්වරයාගේ නම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

416/2023

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකා පොලීසිය සතු නිල සුනඛයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පොලිස් නිල සුනඛයන්ගේ වර්ග කවරේද;

(iii) එම එක් එක් වර්ගය අනුව නිල සුනඛයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොලිස් නිල සුනඛ කොට්ඨාසයට අනුයුක්ත කර ඇති නිලධාරීන් සංඛ්‍යාව;

(ii) වර්ෂ 2017 සිට 2021 දක්වා පොලිස් නිල සුනඛයන්ගේ ආධාරයෙන් අනාවරණය කරගන්නා ලද අපරාධ සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

431/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහාචාර්ය, ආචාර්ය, කලා නිධි, විද්‍යා කීර්ති, විද්‍යා ජෝති, දේශ බන්ධු, දේශ කීර්ති, දේශමාන්‍ය, විශ්ව කීර්ති සහ දේශ ශක්ති ආදී එක් එක් නම්බු නාම/ගෞරව නාම/පදවි පිරිනැමීමට බලය ඇති රාජ්‍ය ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම එක් එක් නම්බු නාමය/ගෞරව නාමය/පදවිය පිරිනැමීමේදී සලකා බලනු ලබන අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් නම්බු නාම/ගෞරව නාම/පදවිවලට අමතරව රජය විසින් පිරිනමනු ලබන වෙනත් ගෞරව නාම/නම්බු නාම/පදවි තිබේද;

(iv) එසේ නම්, ඒවා පිරිනමනු ලබන ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නම්බු නාම/ගෞරව නාම/පදවි පිරිනමනු ලබන ශ්‍රී ලංකාවේ පෞද්ගලික ආයතන/සංවිධාන කවරේද;

(ii) එම එක් එක් ආයතනය/සංවිධානය විසින් පිරිනමනු ලබන නම්බු නාම/ගෞරව නාම/පදවි වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ආයතන/සංවිධාන නියාමනය කිරීම සඳහා රජයේ ක්‍රමවේදයක් තිබේද;

(iv) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(v) ගෞරව නාම/නම්බු නාම/පදවි පිරිනැමීමෙන් පසු එම පුද්ගලයන් සම්බන්ධයෙන් පසු විපරම් කිරීමේ ක්‍රමවේදයක් තිබේද;

(vi) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

690/2023

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කලවන්චිකුඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තුරෙයිනීලාවනෙයි ප්‍රදේශයේ ඇති ග්‍රාමීය රෝහල මේ වනවිට ප්‍රාදේශීය රෝහලක් ලෙස උත්ශ්‍රේණිගත කර ඇති බවත්;

(ii) ඉහත රෝහල සඳහා වෛද්‍යවරුන් දෙදෙනෙකු පත් කළ යුතු වුවත් මේ වනවිට පත් කර ඇත්තේ එක් වෛද්‍යවරයෙකු පමණක් බවත්;

(iii) එම වෛද්‍යවරයාට වෙනත් රෝහලකද රාජකාරී ආවරණය කිරීමට සිදු වී ඇති බැවින් ප්‍රදේශයේ ජනතාව පීඩාවට පත් වී ඇති බවත්;

(iv) මුල් කාලයේ දී ඉහත රෝහලේ ගිලන් රථයක් පැවතියද මේ වනවිට ගිලන්රථයක් නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත රෝහල සඳහා මේ දක්වා ස්ථිර වෛද්‍යවරයෙක් පත් නොකිරීමට හේතු කවරේද;

(ii) එම රෝහල සඳහා ගිලන් රථයක් ලබා නොදීමට හේතු කවරේද;

(iii) ඉහත රෝහල සඳහා ස්ථිර වෛද්‍යවරයෙක් පත් කිරීමට සහ ගිලන් රථයක් ලබා දීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

814/2023

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවට අවශ්‍ය බිත්තර සංඛ්‍යාව දෛනිකව හා වාර්ෂිකව;

(ii) මේ වනවිට ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන බිත්තර සංඛ්‍යාව, දෛනිකව, මාසිකව හා වාර්ෂිකව;

(iii) මේ වනවිට ශ්‍රී ලංකාවේ බිත්තර හිඟයක් පවතින්නේ නම්, එම හිඟය දෛනිකව හා මාසිකව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බිත්තර නිෂ්පාදන කර්මාන්තයේ නියැලී සිටින කුඩා, මධ්‍යම හා මහා පරිමාණයේ නිෂ්පාදකයන් සංඛ්‍යාව;

(ii) දෛනිකව බිත්තර 1000කට වැඩි, 10,000කට වැඩි හා 100,000කට වැඩි යන එක් එක් කාණ්ඩය යටතේ බිත්තර නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදකයන් සංඛ්‍යාව;

(iii) ඉහත (i)හි සඳහන් එක් එක් කාණ්ඩය යටතේ දිනකට නිෂ්පාදනය කරනු ලබන බිත්තර සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) බිත්තරයක් ආනයනය කිරීම සඳහා වැය වන මුදල කොපමණද;

(ii) පාරිභෝගිකයන් සඳහා එම ආනයනික බිත්තරයක් ලබා දිය හැකි මිල කොපමණද;

(iii) බිත්තර ඇතුළු ඇතැම් අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය කූට ව්‍යාපාරිකයන් විසින් ඉහළ මිලකට විකුණන බව පිළිගන්නේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

837/2023

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ, මධ්‍යම රජයට සහ පළාත් සභාවට අයත් පාසල් අතරින් ගුරු හිඟය පවතින, පානීය ජල පහසුකම්, වැසිකිළි පහසුකම්, විද්‍යාගාර, පුස්තකාල සහ ක්‍රීඩා පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් පාසලේ නම සහ ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත පාසල්වල පවතින අඩුපාඩු සම්පූර්ණ කිරීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

851/2023

ගරු ගාමිණී වලේබොඩ මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ඉඩම් බලතල පළාත් සභා වෙත පැවරිය යුතු බවට වර්තමාන රජයේ ප්‍රධානීන් ප්‍රකාශ කර ඇති බව දන්නේද;

(ii) මේ වනවිට මධ්‍යම ආණ්ඩුව සතු ඉඩම් බලතල, පළාත් සභා වෙත පැවරීම සඳහා සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එවැනි අවස්ථාවකදී, එක් පළාතක පදිංචිකරුවකුට වෙනත් පළාතක ඉඩමක් මිලදී ගැනීමේදී අනුගමනය කිරීමට සිදු වන නව නීති සහ රෙගුලාසි කවරේද;

(iv) එවැනි තත්ත්වයකදී සිය පළාත තුළ ඇති ඉඩම් විදේශිකයන්ට හෝ විදේශ සමාගම්වලට විකිණීමට හෝ බදු දීමට යම්කිසි පළාත් සභාවකට බලතල ලැබෙන්නේද;

(v) පළාත් සභාවකට සිය අභිමතය පරිදි එම බලතල සම්මත කර ගැනීමේ අයිතිය ලැබෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3317/2023

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින ගවයන් වර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රදේශවලට ආවේනික ගවයන් සිටින්නේද;

(iii) ශ්‍රී ලංකාවේ සිටින කිරි ගවයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම කිරි ගවයන්ගෙන් දෛනිකව ලබා ගන්නා කිරි ලීටර් සංඛ්‍යාව එක් එක් ගවයන් වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) මේ වනවිට ගැබ්ගෙන ඇති කිරි ගවයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කිරිපිටි ආනයනය කිරීම සඳහා විශාල මුදලක් වැය කරනු ලබන බව දන්නේද;

(ii) එසේ නම්, ශ්‍රී ලංකාවේ කිරි ගවයන් සහ කිරි ගොවීන් ආරක්ෂා කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3318/2023

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වර්තමානයේ බහුල වශයෙන් රිය අනතුරු සිදු වන බව පිළිගන්නේද;

(ii) කොළඹ-මහනුවර ප්‍රධාන මාර්ගයේ, ඉදිගහමුල හන්දිය අසල පසුගිය වසර පහ තුළ සිදුවූ රිය අනතුරු සංඛ්‍යාව සහ එම අනතුරු හේතුවෙන් ජීවිතක්ෂයට පත් වූ පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වැබඩ දෙස සිට කොළඹ-මහනුවර ප්‍රධාන මාර්ගයට පිවිසුම් මාර්ගයක් තිබෙන බවත්;

(ii) වැබඩ මාර්ගයේ සිට ප්‍රධාන මාර්ගයට පිවිසෙන වාහන මහනුවර හෝ කොළඹ දෙසට ගමන් කරන බවත්;

(iii) එම ස්ථානයේ ඇති පදිකමාරුවේ රිය අනතුරු විශාල සංඛ්‍යාවක් සිදු වී ඇති බවත්;

(iv) එම පදිකමාරුව සහ පිවිසුම් මාර්ගය එකම ස්ථානයේ පිහිටා තිබීම එයට හේතු වී ඇති බවත්;

(v) වර්ෂ ගණනාවක සිට ඒ සම්බන්ධයෙන් දැනුම්වත් කළද, මේ වනතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් ස්ථානයේ සිදු වන රිය අනතුරු වළක්වා, ජීවිත හා දේපළ හානි අවම කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3319/2023

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023 වර්ෂය සඳහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙන් අයවැයෙන් වෙන් කළ මුළු ප්‍රතිපාදනය කොපමණද;

(ii) ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් සඳහා වෙන් කළ ප්‍රතිපාදනය ඉහත මුළු ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත ප්‍රතිපාදනයෙන් ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් සඳහා මේ වනවිට නිකුත් කර ඇති මුදල, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2019 සිට 2023 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය විශ්වවිද්‍යාලවල පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා වෙන් කළ සහ නිකුත් කළ ප්‍රතිපාදනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) 2021 සිට 2023 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය, කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සඳහා වෙන් කළ සහ නිකුත් කළ ප්‍රතිපාදන වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද ?